**ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව**
**පුත්තලම දිස්ත්‍රික්කය**
**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2014 මැයි 02 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 11 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය
**------**

මෙම වාර්තාවේ 1.3 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2013 දෙසැම්බර් 31 දිනට ආරච්චිකට්ටුව ප්‍රාදේශිය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**-----------------------**

සභාව සතු සෝනි මයික්‍රෝ කැසට් 01 ක් ඇතුළු උපාංග වල වටිනාකම ගණනය කර ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 නොසැසඳු පාලන ගිණුම්
**---------------------------**

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 07 ක එකතුව රු. 19,791,649 ක් වූ අතර, උපයෝගී ලේඛණ අනුව අදාල ශේෂයන්ගේ එකතුව රු. 19,374,173 ක් වූයෙන් රු. 397,476 ක නොසැසඳු ශේෂයක් අනාවරණය විය.

#### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම
**------------------------------------**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා වටිනාකම රු.42,303,514 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

#### 1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
-----------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 39,671,085 ක්වූ අතර, ඉන් රු.4,030,064 ක් වසර තුන ඉක්මවා තිබූ හිඟ දේපල බදු මුදල් විය. පියවිය යුතුව තිබූ ණයහිමි ශේෂවල වටිනාකම රු. 10,101,156 ක් විය.

**1.3.5 අයවීමට ඇති සේවක ණය**

2013 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය ශේෂවල වටිනාකම රු. 3,400,922 ක්වූ අතර, වසර 5 ඉක්මවූ අයවීමට ඇති ශේෂවල වටිනාකම රු. 143,460 ක් විය. එම ශේෂවලට අදාල කාලවිශ්ලේෂණයක් ගිණුම සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,920,753 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.1,548,161 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම් තථ්‍ය ආදායම් සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | අයවැයගත | තථ්‍ය ලැබීම් | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. ,000 | රු. ,000 | රු. ,000 |
| (අ) වරිපනම් හා බදු | 2,932 | 1,946 | 8,291 |
| (ආ) බදුකුලී | 2,319 | 3,101 | 4,804 |
| (ඇ) වෙළඳ බලපත්‍ර | 925 | 947 | - |
| (ඇ) වෙනත් ආදායම් | 27,713 | 16,409 | 25,697 |

**2.2.2 හිඟ බදුකුලී**

සභාව සතු සතිපොල හා අනෙකුත් දේපල වලින් දීර්ඝ කාලයක් තිස්සේ රු. 4,966,890 ක අයවීම් හිඟහිට තිබූ අතර, හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය තුලදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.3 හිඟ කඩකුලී**

සභාව සතු ගොඩනැගිලි කුලියට දීමෙන් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 399,990 ක් අයවීමට තිබුණි.

**2.2.4** **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i). | උසාවි දඩ | 2,013,250 |
| (ii). | මුද්දර ගාස්තු | 11,102,330 |

2.2.5 වෙළඳ බලපත්‍ර ගාස්තු

------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛණය අනුව වෙළඳ බලපත්‍ර ගාස්තු අයකර ගන්නා ව්‍යාපාරික ස්ථාන 1300 ක් හඳුනාගෙන තිබුණද, ව්‍යාපාරික ස්ථාන 833 කින් පමණක් බලපත්‍ර ගාස්තු අයකරගෙන තිබුණි. ව්‍යාපාරික ස්ථාන 467 කින් බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

**3.1** **අධිභාර**

---------

(අ) ආරච්චිකට්ටුව සතිපොල ගාස්තු එකතු කිරීමේ අයිතිය 2005 වර්ෂයට බදුදීම වෙනුවෙන් අයකරගත යුතුව තිබූ රු.901,705 ක බදු මුදල් අයකර නොගැනීම සම්බන්ධයෙන් සභාවේ සභාපති ඇතුළු නිලධාරීන් වෙත විගණකාධිපතිවරයා විසින් 2011 මාර්තු 24 දින අධිභාර නිවේදනයක් නිකුත් කර තිබුණි. එම මුදලින් වාරික වශයෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු. 113,100 ක් අයකරගෙන තිබූ අතර, තවදුරටත් රු. 788,605 ක් අයවීමට තිබුණි.

(ආ) සභාව විසින් සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ප්‍රමාද කර ගෙවීම හේතුවෙන් පනවා තිබූ රු. 8,468 ක අධිභාර මුදලක් සභාව විසින් එම අරමුදලට ගෙවා තිබූ අතර, එම මුදල් ඉදිරියේදී අධිභාර කිරීමට නියමිතව ඇත.

(ඇ ) සභාව විසින් සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් ප්‍රමාද කර ගෙවීම හේතුවෙන් එම අරමුදල විසින් සභාව වෙත රු. 5,599 ක අධිභාර පනවා තිබූ අතර, එම අධිභාර සභාව විසින් ඉදිරියේදී ගෙවීමට නියමිතව තිබුණි.

**3.2** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වසරේදී ආරච්චිකට්ටුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය වෙත උප පත්‍රිකා ලදු පොත් 70 ක් නිකුත් කර තිබූ නමුත්, එම ලදු පොත් කිසිවක් භාවිතයෙන් පසු නැවත භාරදී නොතිබුණි.

(ආ) ආදායම් රැස්කිරීම සඳහා භාවිතා කරනු ලබන ප්‍රා.ස. 01 උපපත්‍රිකා ලදු පොත් සම්බන්ධ අභ්‍යන්තර පාලනය ඉතා දුර්වල මට්ටමක පවතින බවත්, නිලධාරීන් කීපදෙනෙකු විසින් එකවර

ලදු පොත් 07 ක් පමණ භාවිතා කර තිබු බවත්, නිරික්ෂණය වු අතර, ක්ෂේත්‍රයේදී හා කාර්යාලයේදී රැස්කරගනු ලැබු ආදායම් නිසි ලෙස ගිණුම්ගත වු බවද තහවුරු කරගැනීමට නොහැකි විය.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට රු.3,195,210 ක් වටිනා ට්‍රැක්ටර් හා උපාංග 07 ක් හා රු.125,680 ක් වටිනා යන්ත්‍ර හා උපකරණ 4 ක් භාණ්ඩ සමික්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු කර නොතිබුණි.

**3.3 නිෂ්ක්‍රීය** හා ඌන උපයෝජිත භෞතික සම්පත්

-----------------------------------------------

ඇස්තමේන්තු වියදම රු. 2,685,570 ක් වු ආනවිලුන්දාව මාළු වෙළඳපල ඉදිකිරීම් සඳහා 2005 වර්ෂය තුල රු. 1,618,954 ක වියදමක් දරා ඇතත්, ඉදිකිරීම් නිමකර නොතිබීම හේතුවෙන් මෙතෙක් භාවිතයට නොගෙන නිෂ්කාර්යව තිබුණි.

**4. පද්ධති හා පාලන**

------------------

පහත දැක්වෙන පද්ධති හා පාලන කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ණයගැති හා ණයහිමි පාලනය
(ඉ) වත්කම් කළමනාකරණය